Global Harmonization Initiative
Advocating science-based food safety law and trade

“ආහාර අනුබද්ධිත රෙගුලාසි සහ ව්‍යවස්ථා පිළිබඳව විද්‍යාත්මක සම්මුතියකට එළඹීම හරහා ගෝලීය මට්ටමේ සියලූම පාරිභෝගිකයන් සඳහා සුරක්ෂිත සහ මනාව පිළියෙල වූ ආහාර ද්‍රව්‍ය වල උපයෝජ්‍යතාවය තහවුරු කිරීම”

**මාධ්‍ය සම්බන්ධීකරණය: GHI සන්නිවේදන කණ්ඩායම**

Communications@globalharmonization.net

**ක්ෂණික ප්‍රචාරය සඳහා**

# ගෝලීය සුසංයෝගන ප්‍රථමාරම්භය විසින් ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව ඔත්තු සැපයුම් වෙබ් අඩවිය විවෘත කිරීම

## මෙම නව වෙබ් අඩවිය හරහා ආහාරපාන කර්මාන්තයේ සේවාදායකයන් හට ලෝකයේ ඕනෑම ස්ථානයක සිට තමන්ගේ අනන්‍යතාවය නිර්නාමිකව පවත්වාගෙන ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව බරපතල සිද්ධීන් වාර්තා කිරීමට ඉඩකඩ සපයනු ලැබේ

**(වියෙනා, ඕස්ට්‍රියාව) අගෝස්තු 9, 2021 - ගෝලීය සුසංයෝගී ප්‍රථමාරම්භය (GHI). තොරතුරු සැපයුම්කරුවන්ට ආහාර සුරක්ෂිතතාවයට අනුබද්ධ ඔත්තු සැපයීමේ අරමුණෙන් දියත් කරන ලද වෙබ් අඩවිය** පිළිබඳව මෙසේ සතුටින් ප්‍රකාශ කරමු. මෙම වෙබ් අඩවියට https://whistle.globalharmonization.net ඔස්සේ ලෝකයේ ඕනෑම රටකින්, ආහාරපාන කර්මාන්තයේ ඕනෑම සේවාදායකයෙකුට ප්‍රවේශ වීමට හැක.

*“ලෝකය පුරා ආහාර පාන කර්මාන්තයේ සේවකයන් බහුතරයක් ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව තමන්ගේ අදහස් උදහස් බාහිරයට ප්‍රකාශ කිරීමෙන් වැලකී සිටින්නේ තමන්ගේ අනන්‍යතාවය අනාවරණය වීමෙන් ඇතිවිය හැකි ප්‍රතිවිපාක හේතු කොටගෙනය. යමෙකු තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව කටයුතු කර තොරතුරු සපයන අතර එහි ප්‍රතිපලයක් වශයෙන් බොහෝ පුද්ගලයන් හානිදායක ආහාර වලින් සුරක්ෂිත වුවද, බොහෝවිට ඔත්තුකරුවන්ගේ රැකී රක්ෂා අහිමි වීම සිදුවන අතර, සමහරවිට ඔවුන් ඊටත් වඩා දරුණු ප්‍රතිවිපාක වලට මුහුණ දෙති. මෙය අදටත් බොහෝ ඔත්තුකරුවන්ගේ ඉරණමයි. මේ හේතුවෙන්, GHI ප්‍රථමාරම්භය විසින් ඔත්තුකරුවන් උදෙසා නිර්නාමිකව ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව ඔත්තු සැපයීමට උපකාරී වන වෙබ් අඩවියක් නිර්මාණය කර තිබේ. ඔත්තුකරුවන්ගේ නිර්නාමිකත්වය සුරක්ෂිතව පවත්වාගැනීමට මෙම වෙබ් අඩවිය හරහා ප්‍රමුඛත්වය ලබාදී ඇති අතර, මෙම ඉලක්කය සඵල කරගැනීම උදෙසා GHI ප්‍රථමාරම්භය අන්තර්ජාල අඩවි පදනම් කරගත් පෞද්ගලිකත්වය සහ නිර්නාමිකත්වය ආරක්ෂණ පියවර දියත් කර තිබේ. මීට අමතරව මෙම නිර්නාමික තොරතුරු පත්‍රිකාවන් පිරවීමේ ක්‍රියාවලියේදිද, නැවත නැවතත් වාර්තාකරු/කාරියට තමන්ගේ අනන්‍යතාවය අනාවරණය වන තොරතුරු කිසිවක් ඉදිරිපත් නොකරන ලෙසට මතකයට නැංවේ”* ලෙස GHI සභාපති හුබ් ලෙලිවෙල්ඩ් මහතා ප්‍රකාශ කර සිටියේය.
දිනපතා, ලෝපුරා ආහාරපාන කර්මාන්තයෙන් සුරක්ෂිත, සෞඛ්‍ය සම්පන්න සහ මනාව පිළියෙල වූ නිෂ්පාදන සමස්ථ ගෝලීය ජනගහනය උදෙසා නිකුත් කිරීම සිදුකෙරේ. එනමුදු, යම් අවස්ථා වලදී අකරතැබ්බයෙන් හෝ අරමුණක් සහිතව සුරක්ෂිතතාවය පිළිබඳව යොදවා ඇති ප්‍රමිතින්ට අනුකූල නොවන ආහාර නිෂ්පාදන වෙළඳපලට නිකුත් වීම සිදු වේ. මෙය බරපතල වැරැද්දක් වන අතර GHI ප්‍රථමාරම්භය විසින් නැවැත්වීමට ඉලක්ක කර ඇති කාරණයකි.

ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ගැටලු පොදු ජනතාවගේ සෞඛ්‍යයට තර්ජනාත්මක වන්නේ පරිභෝජයකන්ට හානිදායක මෙන්ම සමහරක්විට මාරාන්තික වීමට පවා ඇති හැකියාව හේතු කරගෙනය. ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව ගැටලු ලෝක ජනගහනයටම තර්ජනයක් වන අතර මිනිසුන්ට සුරක්ෂිත, සුපෝෂිත ආහාර ලබාගැනීමට ඇති හැකියාවට වාරණයක් විය හැක. ලෝකයේ සියලුම රටවල් වල ආහාර වල සුරක්ෂිතතාවයට සම්බන්ධ සිද්ධීන් පිළිබඳව වාර්තාකිරීමේ ප්‍රවණතාවය ඉහල යමින් පවතින අතර මීට ප්‍රධාන හේතුව වශයෙන් සැලකෙන්නේ වැඩිදියුණු කරන ලද පරීක්ෂා කිරීමේ ක්‍රමවේද සහ වාර්තා කිරිමේ ක්‍රියාවලීන්ය. මීට තවදුරටත් උපකාරී වන සිද්ධියක් වන්නේ පරිභෝජකයන් මෙන්ම ආහාර නිෂ්පාදක, සැකසුම් කාරක සහ සැපයුම්දායක සේවාදායකන්ගේ වැඩිදියුණු වූ සූක්ෂමතාවය සහ දැනුවත්කමයි. එනමුදු, ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ සිද්ධි සමුදාය අතරින් වාර්තාගත සිද්ධීන් ලෙස සැලකීමට හැකි වන්නේ අතලොස්සකි. සංඛ්‍යාත්මක වශයෙන් වඩාත් ප්‍රමුඛ වන්නේ වාර්තා වල සටහන් නොවූවද අනතුරුදායක බවින් සමාන හෝ සමහරක්විට වඩාත් භයානක සිද්ධීන්ය. මෙවැනි සිද්ධීන් දිනපතා, ලොවපුරා සියලුම රටවල් වල සාමාන්‍ය ලෙස ක්‍රියාවට නැංවෙන්නේ තිර රෙදි වලට එපිටින්, පොදු ජනතාවගේ මෙන්ම, ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ නිලධාරී සමූහයේ පියවි ඇසට නොපෙනෙන ආකාරයෙනි.

මෙකී අවස්ථා වලදී වඩාත්ම බරපතල අවනඩුව වන්නේ නොසැලකිලිමත්කමේ ප්‍රතිවිපාකයක් ලෙස ඇතිවන අත්වැරදීමය. එනම්; නිශ්චිත ක්‍රියා පටිපාටි අනුගමණය නොකිරීම, හෝ යම්විටක නිවැරදි ක්‍රියාවලින් වලට අනුගත නොවීමයි. සාපරාධී මානසිකත්වයද ආහාර සුරක්ෂිතතාවයට එරෙහි සැලකිය යුතු මට්ටමේ තර්ජනයක් වන අතර මෙය ප්‍රකාශ වන්නේ හිතාමතා, වංචනිකව සිදු කෙරෙන බාල හෝ තහනම් අමුද්‍රව්‍යය පෙරටු කරගෙන සිදුකරන ආහාර සැකසීමේ ක්‍රියාවලීන් හරහාය. මෙකී පියවර ගනු ලබන්නේ වැඩිමණත් ලාභ අත් කරගැනීමේ කූඨ යටි අදහස පෙරදැරිවයි. එහි ප්‍රතිවිපාකයක් ලෙස පරිභෝජකයන්හට විවිධාකර මට්ටමේ හානිදායක අතුරු උපද්‍රව වලට මුහුණ දීමට සිදුවේ.

ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ සාරධර්ම සහ රෙගුලාසි විවිධ රටවල් අතර එකිනෙකට වෙනස් වීම වැලැක්විය නොහැක. සමහරක් රටවල් වල මෙකී ගැටලු වලට මුහුණ දීමේ අරමුණින් පිහිටුවන ලද්දාවූ නිල ඔත්තු සැපයීමේ සේවා නැතුවාද නොවේ. ආණ්ඩුව විසින් මෙම පියවර ක්‍රියාවට නැංවීම විවිධාකාර ක්‍රම වලින් සිදු කරන්නේ, ඔත්තු සැපයුම්කරුවන්ගේ අනන්‍යතාවය සුරක්ෂිතව තබාගැනීම ප්‍රමුඛ ඉලක්කයක් ලෙස සලකමිනි. එනමුදු ඔත්තුකරුවන්ගේ අනන්‍යතාවය සුරක්ෂිතව පවත්වාගැනීමට මෙකී නිල සේවා වලින් සපයන සුරක්ෂිතතාවයද විවිධාකාරය.

සමහරක් රටවල් වලින් සපයන ඉහල සුරක්ෂිතභාවය හමුවේ වුවද යම් පුද්ගලයන් ඔත්තු සැපයීමට මැලි වීමට හෝ එකී කාරණය අනුබද්ධව සාධාරණ දෙගිඩියාවකට හෝ බියකට මුහුණ දීමට හැක. මෙය විශේෂයෙන්ම අදාල වන්නේ ඔවුන්ගේ අනන්‍යතාවය අනාවරණය වීමට හැකි අවස්ථා වලදීය. මෙකී හේතුන් සලකා මෙන්ම ඊට අමතරව ආහාර පරිබද්ධ අනතුරුදායක සිද්ධීන් වාර්තා කිරීමේ වේගය වැඩිකිරීමේ අරමුණින් GHI ප්‍රථමාරම්භය විසින් පහසුවෙන් ප්‍රවේශ වීමට හැකි අන්තර්ජාල අනුබද්ධිත මෙවලමක් වශයෙන් **- ආහාර සුරක්ෂිතතාවය පිළිබඳව ඔත්තු සැපයුම් වෙබ් අඩවිය** දියත් කර තිබේ. ආහාර සැපයුම් දාමයේ ඕනෑම ස්ථානයක, ලෝකයේ ඕනෑම රටක ක්‍රියාශීලී අයෙකු හට පරිශීලනය කළ හැකි අයුරින් ගොඩනගා ඇති මෙම වෙබ් අඩවිය ඔස්සේ ආහාර නිෂ්පාදක සමාගමකින් සපයන නිෂ්පාදනයක් හෝ එකී සමාගමක ක්‍රියාත්මක වන ක්‍රියා පටිපාටියක සුරක්ෂිතතාවය පිළිබඳ තමන්ට ඇතිවන මතවාද, හෝ අදහස් උදහස් ඔත්තු වශයෙන් ලබාදීමට අවශ්‍ය පසුබිම සකසා දී තිබේ. මෙකී වෙබ් අඩවියේ සුවිශේෂීතම අංගය වන්නේ වාර්තා කිරීමේ ක්‍රියාවලිය නිර්නාමිකව සිදුකිරීමට හැකි වීමයි. වර්තමානයේදී අඩවිය ඉංග්‍රීසි බසින් පරිශීලනය කිරීමට හැකි අතර, නුදුරු අනාගතයේදීම විවිධ දේශීය භාෂා වලට පරිවර්තිතව නිකුත් වීමට නියමිතය.

GHI ප්‍රථාරම්භයට ලැබෙන සියලුම අව්‍යාජ වාර්ථා ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ විශේෂඥයින් මඩුල්ලක් විසින් ඇගයීමට ලක් වේ. ප්‍රථාරම්භය විසින් "බරපතල" ලෙස තහවුරු කරන (එනම්: පාරිභෝගිකයන් හට දරුණු හානි පැනවීමට හැකි තර්ජනාත්මක) සිද්ධීන් සම්බන්ධයෙන් GHI ප්‍රථමාරම්භය සලකන ලද රටේ දේශීය නිලධාරීන්ගේ විමර්ශනයට සහ අවධානය නංවනු ලැබේ. මෙම වෙබ් අඩවිය දියත් කරනු ලැබෙන්නේ සමාජ ජාල වෙබ් අඩවි වල දැනුවත්කාරක ව්‍යාපාරයක් පෙරදැරිව, ආහාරපාන කර්මාන්තයේ සේවාදායක ජනතාවට ඇතිවන අදහස් උදහස් සහ මතවාද අන්තර්ජාතික මට්ටමේ මඩුල්ලක්ගේ සැලකිල්ලට ලක්කිරීමේ අරමුණ මූලික කරගෙනයි. පහත සඳහන් තොරතුරු කැටිකරගත් ඡායාරූපය සලකන්න.




ෆේස්බුක්: GHI4FoodSafety | ට්විටර්: @GHI4FoodSafety | ලින්ක්ඩින්: global-harmonization-initiative

ගෝලීය සුසංයෝගන ප්‍රථමාරම්භය (GHI) අන්තර්ජාතික විද්‍යාඥයින් සහ විද්‍යාත්මක සංවිධාන වලින් සම්ප්‍රයුක්ත වූද, ගෝලීය මට්ටමේ ආහාරමය රෙගුලාසි සහ ව්‍යවස්ථා සම්මථකරනය සහ සුසංයෝගනය ඉලක්ක කොටගත් විද්‍යාත්මක පදනම්වූ ජාලාවකි. GHI ප්‍රථමාරම්භය විද්‍යාත්මක පදනමක් සහිතව ගෝලීය මට්ටමේ ආහාර සුරක්ෂිතතාවය නීති සහ රෙගුලාසි සුසංයෝගනය මගින් වෙළඳාමට අනුබද්ධිත නමුත් ව්‍යාජව විද්‍යාත්මක පදනම් සහිත බවට රඟපාන ආහාර පරිබද්ධ සුරක්ෂිතතා නීති සහ රෙගුලාසි බිඳහෙලීම හරහා ගෝලීය සාගින්න ඌනනයට සහ සකල ලෝකවාසී ජනතාවගේ ආහාර සුරක්ෂිතභාවය තිර කිරීමේ අරමුණ සහිත ලාභ සඳහා නොපවත්වන සංවිධානයකි. වැඩිදුර තොරතුරු සඳහා එලඹෙන්න:
www.globalharmonization.net